**කටාන ප්‍රාදේශීය සභාව**
**--------------------------**
**ගම්පහ දිස්ත්‍රික්කය**
**------------------**

1. මූල්‍ය ප්‍රකාශන
-------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.
----------------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ඔක්තෝබර් 05 දින සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
--------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට කටාන ප්‍රාදේශීය සභාවේ සභාවේ මූල්‍ය තත්ත්වය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) මුද්දර ගාස්තු හා උසාවි දඩ ආදායම් මුදල් පදනම මත ගිණුම් තැබීම සභාවේ ගිණුම් ප්‍රතිපත්තිය වුවද සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු උසාවි දඩ මුදල් රු.10,137,000 ක් හා ලැබිය යුතු මුද්දර ගාස්තු රු. 98,245,670 ක් උපචිත පදනම මත ගිණුම් තැබීම හේතුවෙන් අතිරික්තය රු. 108,382,670 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී කර්මාන්ත සඳහා රු. 23,409,835 ක් ගෙවීම් කර තිබුණද ප්‍රාග්ධනිත කර තිබුණේ රු. 8,823,982 ක් පමණක් වීමෙන් රු. 14,585,853 ක් අඩුවෙන් ප්‍රාග්ධනිත කර තිබුණි.

(ඇ) ලැබිය යුතු විමධ්‍යගත හා පළාත් සභා ආධාර ආරම්භක ශේෂය රු.90,932,432 ක් ලෙස වෙනම ගිණුමක් තිබියදී,සමාලෝචිත වර්ෂය අවසානයට එම ගිණුම සඳහා වෙන් කිරීම් රු.10,251,752 ක් වෙනත් ණයගැති ගිණුමකට හර කර තිබුණි. ඉහත වෙන් කිරීම් සඳහා ආධාර මුදල් ලැබීමේදී, ලැබිය යුතු විමධ්‍යගත හා පළාත් සභා ආධාර ගිණුම බැර කිරීම වෙනුවට වෙනත් ණයගැති ගිණුමට බැර කිරීම හේතුවෙන් එම ගිණුමේ රු. 60,969,151 ක බැර ශේෂයක් නිර්මාණය වී තිබූ අතර එය පෙර ගෙවුම් ගිණුමේ රු.200,246 හර ශේෂය සමඟ හිලව් කිරීමෙන් පසු පෙර ගෙවුම් ගිණුම රු. 60,768,905 ක බැර ශේෂයක් ලෙස අවසන් ගිණුම්වල අනුචිත ලෙස දක්වා තිබුණි.

1.3.2 නොසැසඳුණු ගිණුම්
-------------------------

(අ) 2017 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කල ගිණුම හා ලේඛන/උපලේඛන අතර විෂයයන් 08 ක වෙනස්කම්වල එකතුව රු.38,847,043 ක් විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ ගිණුම් අනුව ආදායම හා එදිනට උපයෝගී ලේඛන අනුව ආදායම අතර විෂයයන් 03 ක වෙනස්කම්වල එකතුව රු.50,900,037ක් විය.

1.3.3 අවිනිශ්චිත ගිණුම

--------------------

අවිනිශ්චිත ගිණුමේ රු.18,730 ක් වූ හර ශේෂය වර්ෂ ගණනාවක සිට ඉදිරියට පැවත එන නමුත්, එය හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

1.3.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

---------------------------------------------------------------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති,රීති ,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | |
| (i) රීති 5 ( 7 ) | | මූල්‍ය හා ගබඩා ගනුදෙනු සම්බන්ධයෙන් ප්‍රමාණවත් ආකාරයක අභ්‍යන්තර විගණන ක්‍රමයක් ක්‍රියාත්මක කර නොතිබුණි. |
| (ii) රීති 202 | | එක් එක් වර්ෂය අවසානයේ පාරිභෝගික භාණ්ඩ ලේඛනය සහ තොග පොත් තුලනය කර ශේෂ නව වර්ෂය සඳහා ඉදිරියට ගෙන ගොස් නොතිබුණි. |
| (iii) රීති 213 | | ලේකම්වරයා විසින් අත්සන් කරන ලද නිකුත් කිරීමේ නියෝගයක් නොමැතිව කිසිදු භාණ්ඩයක් නිකුත් කිරීම නොකල යුතු වුවත් ඊට පටහැනිව නිකුත් කිරීමේ නියෝග කිසිවක ලේකම්වරයා විසින් අත්සන් තබා නොතිබු අතර එම භාණ්ඩ භාරගත් බවටද අත්සන් යොදා නොතිබුණි. |
| (ආ) 2016 මැයි 25 දිනැති අංක එල්ජීඩී/05/2016 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය | | ප්‍රාදේශීය සභාව විසින් 2007 වර්ෂයේදි සිදුකල දේපල තක්සේරුව මත පදනම්ව සමාලෝචිත වර්ෂය දක්වාම වරිපනම් බදු අය කර තිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

---------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 114,308,008 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 82,122,028 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම් , බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

(අ) සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්,බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිගය |
| | | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| (i) | වරිපනම් හා බදු | 34,469 | 35,336 | 34,314 | 30,054 | 50,286 | 38,634 | 39,976 | 30,353 |
| (ii) | කුලී | 1,593 | 1,022 | 1,045 | 8 | 952 | 1,013 | 902 | 36 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 980 | 1,187 | 1,187 | - | 865 | 1,157 | 1,161 | - |
| (iv) | වෙනත් ආදායම් | 190,026 | 179,686 | 71,298 | 14 | 6,869 | 12,477 | 112,678 | 14 |

### 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

(අ) සමාලෝචිත වර්ෂය ආරම්භයට තිබූ හිඟ වරිපනම් ආදායමින් වර්ෂය තුල රැස් කර තිබූණේ රු.11,559,075 ක් බැවින් හිඟ අය කිරීම සියයට 38 ක් වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත බලපත්‍ර ආදායමට වඩා බිල් කිරීම් සියයට 21 කින් වැඩිවී තිබූ බැවින් ඇස්තමේන්තු කිරීම තාත්වික ආකාරයෙන් සිදුකර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ බිල් කර තිබූ වෙනත් ආදායමින් රැස් කර තිබුණේ සියයට 37 ක් පමණි.

### 2.2.3 වරිපනම් හා බදු

පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) 2007 වර්ෂයේ සිදුකල වරිපනම් තක්සේරුවේදී ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල පිහිටි ගම් සහ මාර්ගයන් 07 කට අදාලව වරිපනම් ඒකක මඟ හැරී තිබූ අතර සමාලෝචිත වර්ෂය වන විටද එම ඒකක සඳහා වරිපනම් බදු අයකර ගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි.

(ආ) 2017 දෙසැම්බර් 31 දිනට ප්‍රාදේශිය සභාවේ රු.5,000 ට වැඩි හිඟ වරිපනම් වටිනාකම රු.7,272,988 වී තිබුණි. මෙම හිඟ අයකර ගැනීමට හෝ දේපල තහනම් කිරීමට සභාව විසින් පියවර ගෙන නොතිබුණි.

(ඇ) 2017 දෙසැම්බර් 31 දිනට කටාන, ආඩිඅම්බලම, රද්දොළුව හා දෙමන්හංදිය යන උපකාර්යාල වල පැවති වරිපනම් හිඟයෙන් 2018 මාර්තු 31 වන විට අයකර ගෙන තිබූ ප්‍රතිශතය පිළිවෙලින් සියයට 7.8, සියයට 10.9, සියයට 15.6 හා සියයට 12.5 ක් විය.

(ඇ) 2017 දෙසැම්බර් 31 දිනට පැවති රු.30,054,061 ක වරිපනම් හිඟයෙන් 2018 මාර්තු 31 දින වන විට අයකර ගත යුතු වරිපනම් හිඟය රු.26,771,337 ක් වුවද දේපල තහනම් කිරීමේ නියෝග නිකුත් කර තිබුණේ රු.2,185,802 ක් වූ දේපල 580 ක් සඳහා පමණි.

(උ) රද්දොළුව උප කාර්යාලයට අදාලව 2017 දෙසැම්බර් 31 දිනට පැවති රු.6,065,988 ක වරිපනම් හිඟයෙන් 2018 මාර්තු 31 දින වන විට අයකර ගත යුතු රු. 4,163,794 ක් සඳහා රතු නිවේදන නිකුත් කිරීමට කටයුතු කර නොතිබුණි.

2.2.4 බලපත්‍ර ගාස්තු

----------------

සංචාරක සංවර්ධන පනත යටතේ ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි හෝටල්වලින් පසුගිය වර්ෂයේ මුළු පිරිවැටුපෙන් සියයට 1 ක් නොඉක්මවූ බලපත්‍ර ගාස්තුවක් අයකර ගත යුතු වුවත් ආඬිඅම්බලම උප කාර්යාල බල ප්‍රදේශයේ වූ ටැමරින්ඩ් ට්‍රී හෝටලයෙන් මේ දක්වා කිසිදු බලපත්‍ර ගාස්තුවක් අයකර ගෙන නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

3.1 කාර්යසාධනය

-----------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම,ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

තිරසර සංවර්ධන ඉලක්ක

-----------------------------

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව විසින් දැනුවත්වීමක් සිදුව නොතිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

-------------------------------------

(අ) 2001 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා සේවක අර්ථ සාධක අරමුදලට දායක මුදල් ගෙවීම ප්‍රමාද කිරීම හේතුවෙන් අංක L33/854 දරන 2017 මැයි 18 දිනැති නඩු තීන්දුව මගින් රු.317,792 ක අධිභාරයක් ගෙවීමට ප්‍රාදේශීය සභාවට සිදුවී තිබුණි. මෙය ප්‍රමාද කිරීමට වගකිව යුතු නිලධාරීන් තිදෙනකුගෙන් එක් අයකු පාඩුව පියවීමට පැහැර හැරීම නිසා සභා අරමුදලට රු. 275,874 ක පාඩුවක් සිදුව තිබුණි.

(ආ) වලිසිංහ හරිශ්චන්ද්‍ර ක්‍රිකට් ක්‍රීඩාපිටිය පිහිටි ඉඩම 2002 නොවැම්බර් 01 දින අත්සන් කර ඇති ගිවිසුමට අනුව ගම්පහ දිස්ත්‍රික් සංගමය වෙත අවුරුදු 30 ක් සඳහා බදු දීමට කටයුතු කර තිබුණි. බදුකරු විසින් බදු ගිවිසුමේ කොන්දේසි ප්‍රකාරව සංවර්ධන කටයුතු කිසිවක් සිදු නොකිරීම, ක්‍රීඩාංගනය තරඟ ලබාදීම මගින් ලැබෙන මුදලින් සභාවට ලැබිය යුතු කොටස ගෙවා නොතිබීම, අතුරු බදු දීමක් සිදුකර තිබීම සහ මුලින් ගෙවන ලද රු. 180,000 ක මුදලක් පමණක් ලැබී තිබීම මත 2007 ඔක්තෝබර් 27 දින ගිවිසුම අවලංගු කර තිබුණි. එසේ වුවත් අදාල ක්‍රීඩා සමාජය විසින් ගිවිසුම අවලංගු කල දින සිට වසර 10 කට ආසන්න කාලයක් සභාවට කිසිදු මුදලක් නොගෙවා සිය කටයුතු කර ගෙන ගොස් තිබූ අතර ඊට විරුද්ධව සභාව කිසිදු ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණි. තවද හෙක්ටයාර් 5.5840 ක ක්‍රිකට් පිටිය සමඟ මුළු ඉඩම් ප්‍රමාණය වූ හෙක්ටයාර් 8.8527 ක් 2002 වර්ෂයේ සිට 2018 ජූලි මාසය වනතෙක් කිසිදු සංවර්ධනයක් කර නොතිබූ අතර සභාවට විශාල ආදායමක් ලබා ගැනීමට තිබූ අවස්ථාව අහිමි වී තිබුණි.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-------------------------------

(අ) කඳවල අයිවන් සිල්වා මාවතේ පිහිටි සබීඩියාවත්ත පෞද්ගලික ඉඩමක අක්කරයක පමණ භූමි ප්‍රමාණයක ප්‍රදේශවාසීන්ගේ සුභ සිද්ධිය සඳහා වැවක් ඉදි කර දෙන මෙන් සභාවේ සභාපති විසින් කර තිබූ ඉල්ලීමකට අනුව 2012 වර්ෂයේ අඩි 270 ක් දිග අඩි 103 ක් පළල හා අඩි 20 ගැඹුරු පොකුණක් ඉදිකිරීමට ඉඩමේ අයිතිකාරිය කටයුතු කර තිබූ අතර ඉවත් කරන පස් හා මඩ

සබීඩියාවත්තේ වගුරුබිම් ගොඩ කිරීමට යොදාගෙන තිබුණි. ඒ සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ , නාගරික සංවර්ධන අධිකාරියේ හා ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධන කිරීමේ සංස්ථාවේ නිර්දේශ හා අනුමැතින් ලබාගෙන නොතිබුණි.මේ නිසා ප්‍රදේශය දැඩි ගංවතුර තර්ජනයකට ලක්වන බව පවසමින් ප්‍රදේශවාසීන් සිය විරෝධතා ප්‍රාදේශීය සභාව වෙත ඉදිරිපත් කර තිබූ අතර ජලය පිරී ඇති වලක් සහිත අක්කරයක භූමි ප්‍රමාණය 2012 මැයි 10 දින ඔප්පුවක් මගින් සභාවට පවරා තිබුණි. 2018 ජුනි 11 වන දින ස්ථානීය පරීක්ෂාව වන විට පොකුණ වටා ප්‍රාදේශීය සභාව විසින් කම්බි ගසා තිබුණු අතර පොකුණ සහිත ඉඩම සභාව වෙත පවරා වසර 06 ක් පමණ ගතවී තිබුණද එය ප්‍රදේශවාසීන්ගේ සුභ සිද්ධිය සඳහා යොදා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) අක්කර 05 රූඩ් 03 පර්චස් 17 1/2 ක් වන කඳවල අයිවන් සිල්වා මාවතේ සබීඩියා වත්ත ඉඩම කට්ටි කර විකිණීමට එහි අයිතිකරු විසින් 2015 මැයි 03 දින බිම් කට්ටි සැලැස්මක් සභාවට ඉදිරිපත් කර තිබුණද ඒ සඳහා අනුමැතිය ලබාදී නොතිබියදී බිම් කට්ටි විකිණීම් සිදුකර තිබූ අතර ගැණුම්කරුවන් නිවාස ඉදිකර පදිංචිවී තිබුණි. බිම් කට්ටි සැලැස්ම අනුමත කර නොතිබුණද පොදු ඉඩම හා මාර්ග ඔප්පුවක් මඟින් සභාවට පවරා තිබු අතර අනුමැතියකින් තොරව බිම් කට්ටි විකිණීම හා විකුණුම් වටිනාකමින් සියයට 1 ක බදු මුදල සභාවට නොගෙවීම සම්බන්ධයෙන් ඉඩම් හිමිකරුට විරුද්ධව සභාව විසින් නෛතික ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

3.4 වත්කම් කළමණාකරණය
-----------------------------

3.4.1 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය
--------------------------------

(අ) රද්දොළුව උපකාර්යාලයට අයත් උදම්මිට බහුකාර්ය ගොඩනැගිල්ලෙහි ස්ථාපිත කර තිබූ කායවර්ධන මධ්‍යස්ථානය සඳහා, බස්නාහිර පළාත්, ක්‍රීඩා අමාත්‍යාංශයෙන් ලබා දී තිබූ leg pull down කායවර්ධන උපකරණයෙහි භෞතික පැවැත්ම, වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය මගින් තහවුරු නොවිණි.

(ආ) 2017 මාර්තු 30 දිනැති ලේකම්ගේ ලිපිය ප්‍රකාරව, භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල නිර්දේශයන් අනුව වෙන්දේසි කර හෝ විනාශ කර තිබූ භාණ්ඩවල වටිනාකම තක්සේරු කර ගිණුම් වල අවශ්‍ය ගැලපීම් සිදු කර නොතිබුණි.

(ඇ) උදම්මිට බහුකාර්ය ගොඩනැගිල්ල සඳහා සමාලෝචිත වර්ෂයේ මිලදීගෙන තිබූ ප්‍රමාණය 252 ක් වූ භාණ්ඩ හා උපකරණ වර්ග 09 ක් හා වටිනාකම දක්වා නොතිබූ ප්‍රමාණය 24 ක් වූ භාණ්ඩ වර්ග 17 ක් 2018 ජුනි 30 වන විටත් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

3.4.2 තොග පාලනය
---------------

(අ) ඉන්ධන තොග ගණනය සඳහා ක්‍රමවේදයන් භාවිතා කර නොතිබූ හෙයින් වාර්ෂික තොග සමීක්ෂණයක් සිදු කිරිමට නොහැකිව තිබූ අතර ලේඛනගත ශේෂය පමණක් ගිණුම්වලට ගෙන තිබුණි.

(ආ) ද්‍රව්‍ය නිකුත් කිරීම්, ගබඩා ද්‍රව්‍ය ලේඛනවල ඇතුලත් කර නොතිබූ අවස්ථා වූ අතර ඇටඹගහවත්ත නව ජනපද පාර පැච් කිරීම සඳහා 2017 සැප්තැම්බර් 22 දින රු. 509,236 ක ද්‍රව්‍ය නිකුත් කර තිබුණද ඒවා ලේඛනවල ඇතුළත් කර නොතිබුණි.

(ඇ) පළමුවර තාර දැමීමේ දින සිට දෙවන වර තාර දැමීම සඳහා කාලයක් ගතවුනද තාර නිකුත් කිරීමේදී පළමුවර හා දෙවන වර තාර දැමීම සඳහා එක්වර මුළු ප්‍රමාණයම නිකුත් කර තිබුණි.

3.5 ප්‍රසම්පාදනය
-------------
කොන්ත්‍රාත් පරිපාලනය
-------------------------

(අ) 2017 මුළු වර්ෂයට තැනීම් ද්‍රව්‍ය 14 ක් මිලදී ගැනීම සඳහා 2016 දෙසැම්බර් 21 දින සැපයුම්කරුවන් 09 දෙනකු ලියාපදිංචි කර තිබූ අතර ඒ අතරින් 07 දෙනෙකු විසින් 4" x 4" කළුගල් හා වැලි පමණක් සඳහන් කර තිබූ මිල ගණන්වලට සැපයිය නොහැකි බව දන්වා තිබීම නිසා 4" x 4" කළුගල් හා වැලි සඳහා පමණක් නැවත මිල ගණන් කැඳවීම් නොකර ද්‍රව්‍ය 14 සඳහාම 2017 අප්‍රේල් 11 දින නැවත මිල ගණන් කැඳවා තිබුණි. මෙහිදී තැනීම් ද්‍රව්‍ය 05 ක මිල වැඩිවීම නිසා එම ද්‍රව්‍ය 05 මිලදී ගැනීමේදී වැඩි මිලක් ගෙවීමට සිදුවීමෙන් සභාවට රු.644,815 ක පාඩුවක් සිදුවී තිබුණි.

(ආ) මඩවල ප්‍රජා ශාලාව ඉදිකිරීමේ 1 වන අදියර සඳහා රු. 1,493,589 ක වටිනාකමකට මාස 3 කින් නිම කිරිමට 2016 දෙසැම්බර් 23 දින ගිවිසුම් වී තිබූ අතර 2018 ජුනි 30 දින වන විටත් මෙම ව්‍යාපෘතිය ආරම්භ කර නොතිබුණි. සභාව විසින් කොන්ත්‍රාත්තුව අත්හිටුවන ලෙසටද උපදෙස් ලබාදී නොතිබූ නමුත් කොන්ත්‍රාත්කරු සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කර නොතිබුණි.

(ඇ) අරඹ ප්‍රධාන මාර්ගය සංවර්ධනය කිරිම සඳහා රු.1,694,750 ක වටිනාකමකට සති දෙකකින් නිම කිරිම සඳහා 2017 නොවැම්බර් 27 දින ගිවිසුම් ගත වී තිබුණද 2018 ජුනි 30 දින වන විටත් මෙම ව්‍යාපෘතිය ආරම්භ කර නොතිබුණි. සභාව විසින් කොන්ත්‍රාත්තුව අත්හිටුවන ලෙසටද උපදෙස් ලබාදී නොතිබූ නමුත් කොන්ත්‍රාත්කරු සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කර නොතිබුණි.

(ඈ) ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේ වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය අසල සායනය හා ප්‍රජාශාලාව ඉදිකිරීමේ දෙවන අදියර සඳහා රු. 2,480,432 ක වටිනාකමකට 2012 දෙසැම්බර් 31 දින මාස 3 1/2 කින් නිම කිරීමට ගිවිසුම් ගත වී තිබූ අතර කාර්ය නිම කිරීම සඳහා මාස 5 1/2 ක් ගතව තිබූ නමුත් ඒ සඳහා ප්‍රමාද ගාස්තු අයකර නොතිබුණි.තුන්වන අදියර සඳහා ගම නැගුම සංවර්ධන වැඩසටහන යටතේ රු.5,000,000 ක් 2014 වර්ෂයේ ලැබී තිබුණද වැඩ නිම කර තිබුණේ 2015 වසරේදී විය. මෙහි හතරවන අදියර සඳහා රු. 1,965,945 ක වටිනාකමකට 2016 දෙසැම්බර් 23 දින මාස තුනකින් නිම කිරීමට ගිවිසුම් ගතවී තිබූ අතර 2017 වර්ෂය අවසානය වන විටත් කාර්ය නිමකර නොතිබුණි. කොන්ත්‍රාත්තුව අත්හිටුවන ලෙස සභාව උපදෙස් ලබාදී නොතිබූ නමුත් කොන්ත්‍රාත්කරු සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කර නොතිබුණි. එහි 5 වන අදියර සඳහාද එම කොන්ත්‍රාත්කරු සමඟ රු.1,485,000 ක වටිනාකමකට 2017 ඔක්තෝබර් 03 දින මාස 03 කින් නිම කිරීමට ගිවිසුම් ගතවී තිබූ අතර 2018 ජුනි 30 දින වන විටත් එම කාර්යද නිම කිරිමට කොන්ත්‍රාත්කරු අපොහොසත්වී තිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහ පාලනය
-------------------------------------
අභ්‍යන්තර විගණනය
------------------------
ආයතනය තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

5. පද්ධති හා පාලන
--------------------
විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධතිය | අඩුපාඩුව |
|---|---|---|
| (අ) | ආදායම් පාලනය | වරිපනම් හිඟ අය කර ගැනීමට කටයුතු නොකිරීම. |
| (ආ) | ගිණුම්කරණය | ශේෂ වෙනස්කම් පැවතීම හා අවිනිශ්චිත ගිණුම නිරාකරණය කර නොගැනීම. |
| (ඇ) | ප්‍රසම්පාදනය | ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල නොකිරීම. |
| (ඈ) | වත්කම් පාලනය | සමහර වත්කම් සමීක්ෂණයට ඉදිරිපත් නොකිරීම. |